අවසන් කාලය වන විට අඥාන, මුහුකුරා නොගිය පිරිසක් පැමිණෙනු ඇත. යහපත් වචනයෙන් යුත් ප්රකාශ (අල්-කුර්ආනය) ඔවුහු පවසති. ඊතලයක් එහි ඉලක්කයෙන් පිටවන්නාක් මෙන් ඉස්ලාමයෙන් ඔවුන් ඉවත් වනු ඇත

අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. "ඔබට මා අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පිළිබඳ කතා කරන්නේ නම්, එතුමාණන් කෙරෙහි අසත්ය ප්රකාශ කිරීමට වඩා අහසින් ඇද වැටීම මට ප්රිය මනාප වන්නේය. මා අතර හා ඔබ අතර මා කතා කරන විට, සැබැවින්ම යුද්ධය යනු උපාය මාර්ගයකි. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශයකට මම මෙසේ සවන් දී ඇත්තෙමි." "අවසන් කාලය වන විට අඥාන, මුහුකුරා නොගිය පිරිසක් පැමිණෙනු ඇත. යහපත් වචනයෙන් යුත් ප්රකාශ (අල්-කුර්ආනය)
ඔවුහු පවසති. ඊතලයක් එහි ඉලක්කයෙන් පිටවන්නාක් මෙන් ඉස්ලාමයෙන් ඔවුන් ඉවත් වනු ඇත. ඔවුන්ගේ දේවවිශ්වාසය උගුරෙන් ඔබ්බට යන්නේ නැත. ඔබ ඔවුන් කොතැනක දුටුවත් ඔවුනට
මරණ දඬුවම පිරිනමන්න. සැබැවින්ම ඔවුනට මරණ දඬුවම පිරිනැමීම වනාහි, මළවුන් කෙරෙන් නැගිටවනු ලබන දිනයේ එසේ මරණ දඬුවම ක්රියාත්මක කළ තැනැත්තාට ප්රතිඵල ඇත."
[صحيح] [متفق عليه]

දේවත්වය විශ්වාස කළ මුඃමින්වරුන්ගේ නායකයකු වූ අලී ඉබ්නු අබී තාලිබ් තුමා විසින් මෙසේ දන්වන ලදී. "මම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ගැන යමක් පවසා සිටින අවස්ථාවේ නුඹලා එයට සවන් දෙන විට, සැබැවින්ම මම යමක් සඟවා හෝ යමක් නිරූපණය කර හෝ යමක් වසන් කර හෝ එතුමාණන් ගැන පවසන්නේ නැත. සැබැවින්ම මම පැහැදිලිව පවසා සිටිමි. මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කෙරෙහි බොරුවක් පවසමින් එතුමාණන් ගැන කතා කිරීමට වඩා මම අහසින් ඇද වැටීම මට පහසු හා සැහැල්ලු කටයුත්තකි. මා අතර හා මිනිසුන් අතර යමක් මම කතා කරන්නේ නම්, සැබැවින්ම යුද්ධය යනු උපාය මාර්ගයකි. සැබැවින්ම මම යමක් සඟවා හෝ යමක් නිරූපණය කර හෝ යමක් වසන් කර හෝ පවසන්නේ නැත. අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්රකාශයකට මම මෙසේ සවන් දී ඇත්තෙමි." "අවසන් කාලය වන විට බුද්ධි හීන, වයසින් අඩු තරුණ පිරිසක් පැමිණෙනු ඇත. ඔවුහු අල්-කුර්ආනයෙන් කරුණු ඉදිපත් කරති. අධික ලෙස එය කියවති. ඊතලයක් එහි ඉලක්කයෙන් පිටවන්නාක් මෙන් ඔවුන් ඉස්ලාමයෙන් බැහැර වෙති. එහි සීමාවන් උල්ලංඝනය කරති. ඔවුන්ගේ විශ්වාසය උගුරෙන් ඔබ්බට යන්නේ නැත. ඔබ ඔවුන් කොතැනක දුටුවත් ඔවුනට මරණ දඬුවම පිරිනමන්න. සැබැවින්ම ඔවුනට මරණ දඬුවම පිරිනැමීම වනාහි, මළවුන් කෙරෙන් නැගිටවනු ලබන දිනයේ එසේ මරණ දඬුවම ක්රියාත්මක කළ තැනැත්තාට ප්රතිඵල ඇත."

http://www.sunnah.global/hadeeth/si/show/65868